**ශීර්ෂය 282 වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 23 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 30 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් රු. 3,115,635,495 ක් ලෙස දක්වා තිබුණි. එම වටිනාකම රු.4,805,224,866 ක් වීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය රු.1,689,589,371 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී පෙන්වා දී ඇති අඩුපාඩුව නිවැරදි කිරිමට කටයුතු කරන බව දක්වමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම්වල වටිනාකම නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්රියාකාරකම්වලින් වැය කිරීම් යටතේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් රු.8,450,855,107 ක් ලෙස දක්වා තිබුණද, භාණ්ඩාගාර සටහන් අනුව රු.6,761,265,736 ක් වීම නිසා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය රු.1,689,589,371 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී පෙන්වා දී ඇති අඩුපාඩුව නිවැරදි කිරිමට කටයුතු කරන බව දක්වමි. | ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

---------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයේදී දෙපාර්තමේන්තුවේ කලාප අධ්‍යක්ෂ කාර්යාලවල හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල ඉඩම් අක්කර 4,735 පර්චස් 123 ක් හා බණ්ඩාරවෙල, ගාල්ල, නුවර, පොළොන්නරුව, මොනරාගල, හම්බන්තොට වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලවල පිහිටි ගොඩනැගිලි 392 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු සමග එකඟ වන අතර, අදාළ වත්කම් ගිණුම් ගත කිරීමට පෙර විධිමත් පරිදි තක්සේරු කරගත යුතු බැවින්, ඒ සඳහා 2020 ජූලි 28 හා 2020 සැප්තැබර් 18, දිනැති ලිපි මගින් අදාල වත්කම් තක්සේරු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. | දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම් ගත කළ යුතු වීම. |

### 1.6.3 අග්‍රිම ශේෂය

-------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනය සමග ඉදිරිපත් කර තිබුණු අග්‍රිම ගැලපුම් ගිණුමෙහි අත්තිකාරම් බී ගිණුමෙහි ගැලපීම රු.1,061,226 ක්, තැන්පත් ගිණුමෙහි රු.949 ක් හා පෙර වර්ෂ මුදල් වැය කිරීම් රු.2,144,247 ක් ගැලපීම් කර නොතිබුණි. | අග්‍රිම ගැලපුම් ගිණුමෙහි අත්තිකාරම් බී ගිණුම යටතේ සියළුම ගැලපීම් සිදු කර ඇති අතර, තැන්පත් ගිණුමෙහි රු.949 ශේෂය තැන්පත් ගිණුමට ගැලපීම් කර ඇත. පෙර වර්ෂ වල මුදල් වැය කිරීම් වන රු.2,145,193 ක මුදල අග්‍රිම ගිණුමෙහි පහතින් ගැලපීම් කර ඇත. | අග්‍රිම ගැලපුම් ගිණුමෙහි දැක්විය යුතු ශේෂ නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය. |

1.6.4 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **හානි** හා පාඩු ලේඛනය<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව **හානි** හා පාඩු ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණු අතර 2009 සිට 2020 වර්ෂය දක්වා සිදුවී තිබුණු වටිනාකම රු.2,184,031 ක් වූ හානි හා පාඩු 7 ක් එම ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි. | ඉදිරියේදී මෙම ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වමි. | හානි හා පාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කල යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කිරීමට සැලසුම් කර තිබුණු මුළු අග්‍රිම අවශ්‍යතාවය රු.19,555,662,298 ක් විය. පෙර වර්ෂයේ බැරකම්ද ඇතුලත්ව සමාලෝචිත වර්ෂයේ වියදම් සඳහා රු.35,238,831,421 ක් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරයෙන් ඉල්ලා තිබුණු නමුත් ලැබී තිබුණු මුළු ප්‍රතිපාදනය රු.14,093,489,206 ක් වී තිබුණි. එම ලැබී තිබුණු අග්‍රිමය ඉල්ලුම් කරන ලද අග්‍රමයේ ප්‍රතිශතයක් ලෙස සියයට 35.51 ක් විය. එම නිසා අග්‍රිම සැලසුම් කිරීම දුර්වල මට්ටමක පැවතුණි. | අදාල මාසයට පෙර මාසය දක්වා බැරකම් සඳහා නොලද අග්‍රීමද ඇතුලත්ව වරින් වර භාණ්ඩාගාරයෙන් මාසිකව අයදුම් කරන ලද අග්‍රීම මුදලේ එකතුව රු. 35,238,831,421 කි. වාර්ෂික අයවැය ලේඛනය මගින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ වෙනත් දෙපාර්තමේන්තු යටතේ වෙන් කරන ලද මුලු අයවැය ප්‍රතිපාදන මුදල රු.19,555,662,298 ක් වන අතර එම මුදලෙන් රු. 14,093,489,206 ක මුදලක් භාණ්ඩාගාරය විසින් 2020 දෙසැම්බර් 31 දින වන විට නිදහස් කර ඇත. ඒ අනුව ලබා දී ඇති අග්‍රීමය වරින්වර භාණ්ඩාගාරයෙන් අයදුම් කරන ලද අග්‍රීමයෙන් අඩු ප්‍රතිශතයක් වුවත් එය මුලු ප්‍රතිපාදන මුදලෙන් සියයට 72 කි. | ඉදිරි වර්ෂයේදී ඉටු කිරීමට නියමිත කාර්යයන් නිසි පරිදි හදුනාගෙන අග්‍රිම ඉල්ලුම් කළ යුතු වීම. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තු සකස් කිරීමේ දී අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව වෙන් කිරීම් සිදු කිරීම සහ සැළසුම් කළ පරිදි වැඩ කටයුතු නොකිරීම යන හේතු නිසා රු.11,640,560,000 ක් වූ ශුද්ධ වෙන් කිරීම් වලින් රු.44,356,717 ක් ඉතිරි වී තිබුණි. | වරින් වර සංචරණ සීමා පැනවීම හේතුකොටගෙන කාර්යාල කටයුතු දෛනිකව සිදු නොවීම, කොරෝනා වසන්ගතය හේතුවෙන් රැස්වීම් පැවැත්වීම Zoom මාර්ගගත තාක්ෂණ ක්‍රමය මාර්ගයෙන් පැවැත්වීම සංග්‍රහ වියදම් හා වෙනත් වියදම් අවම වීම, නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | අයවැය සකස් කිරීමේදී හැකිතාක් දුරට විචලතා අවම වන පරිදි සිදු කළ යුතු වීම. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් පමණක් දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවාවක් හෝ සැපයුමක් සඳහා කිසියම් වියදමකට හෝ බැඳීමකට හෝ එළඹිය හැකි වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අනුමත ප්‍රතිපාදන ඉක්මවා රු.1,028,428,600 ක බැඳීම් ඇති කර ගෙන තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වාර්තාවේ 94(1) යටතේ බැරකම් ලෙස රු.247,836,264 දක්වා ඇත. බැරකම් ලෙස දක්වා ඇත්තේ ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලවල අත්‍යවශ්‍ය මෙහෙයුම් හා නඩත්තු වියදම්ය. මෙම වර්ෂය තුල අතුරු සම්මත ගිණුම් 4ක් යටතේ ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර, ඒ ඒ එම ගිණුම් කාල සීමාව අවසානයේදී වෙන්කරන ලද ප්‍රතිපාදන අහෝසි කර ඇතත් ඒ වන විට දරන ලද බැරකම් අහෝසි කිරීමේ හැකියාවක් නොමැත. ඒ අනුව 2020 වර්ෂය සඳහා අතුරු සම්මත ගිණුම මගින් ලබා දී ඇති ප්‍රතිපාදන බැරකම් නිරවුල් කිරීමට ප්‍රමානවත් නොවීම නිසා බැරකම් ලෙස විසර්ජන ගිණුමට ඇතුලත් කර ඇත. | මුදල් රෙගුලාසි 94(3) විලම්භිත බැරකම් සඳහා එළඹීමේදී මුදල් රෙගුලාසි 447(5) ප්‍රකාරව ගිණුම් හා වාර්තා සකස් කිරීම කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම මුදල් වර්ෂයේ දී නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊලග වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවටත්, එම උපදෙස්වලට පටහැනිව ඇතිකර ගන්නා වගකීම් නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාර තවදුරටත් කටයුතු කරනු නොලබන බවටත් උපදෙස් දී තිබියදී 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තාවේ රු.1,324,545,470 ක බැරකම් නිරීක්ෂණය විය. ඒ අනුව 2020 වර්ෂයේ ඉතිරිකිරීම් ඉක්මවා රු.1,280,188,753 ක බැරකම් ඇති කරගෙන තිබුණි. | මු.රෙ. අංක 94(3) යටතේ බැරකම්වලට එළඹීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට අධිකාරී බලයක් හිමිව ඇත. ඒ අනුව වැඩසටහන් 2 යටතේ ව්‍යාපෘති 3 (විශාල ව්‍යාපෘති) හා ව්‍යාපෘති 4 (මධ්‍යම ව්‍යාපෘති) වල බැරකම්වල එකතුව රු.1,072,785,316 ලෙස දක්වා ඇත. ව්‍යාපෘති 3 හා ව්‍යාපෘති 4 හි ප්‍රතිපාදන ඉතිරිවීම් 4,451,289 ලෙස මූල්‍ය ප්‍රකාශනෙහි දක්වා ඇත. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 ට අනුකූල ලෙස බැරකම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව 2020 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් ප්‍රමාණය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන ලද තොරතුරු පද්ධතිය දිනපතා යාවත්කාලීන කිරීම සඳහා සෑම වියදම් ඒකකයක්ම සම්බන්ධයෙන් ඇති කරගන්නා බැදීම් බැරකම් හා එම බැරකම් නිදහස් කිරීම් පිළිබදව තොරතුරු වෙබ් අඩවියට උත්පනය (Up lord) කළ යුතු බවට උපදෙස් ලබා දී තිබුණ ද එම තොරුතුරු යාවත්කාලීන කර නොතිබුණි. | සිගාස් ගිණුම්කරන පද්ධතියට බැරකම් ඇතුලත් කල හැක්කේ ඒ සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන පවතින්නේ නම් පමණි. නමුත් ඉහත කරන ලද පැහැදිලි කිරීම අනුව අදාල බැරකම් වලට ප්‍රතිපාදන නොමැතිව වුවද ඇතුලත් කිරීමට සිදුව තිබුණි. එබැවින්, සිගාස් ගිණුම් කරන පද්ධතිය යාවත්කාලීන කිරීමද කල නොහැකිව තිබු අතර මේ පිළිබඳව භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් සමගද සාකච්ඡා කරන ලද බවද කාරුණිකව දන්වමි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 255/20 ට අනුකූලව බැරකම් පිළිබද වාර්තා කළ යුතුය. |

## 2.4 තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට ටෙන්ඩර් තැන්පත්, කොන්ත්‍රාත් හා තාවකාලික රැඳවුම් මුදල් යනාදී පොදු තැන්පත් ගිණුම්වල වර්ෂ 02 කට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබුණු රු.387,626,301 ක් වූ අතර මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. එම තැන්පත් ශේෂය තුළ වර්ෂ 5 ඉක්ම වූ ශේෂය වූ රු.2,425,275 ක් විය. | ටෙන්ඩර් තැන්පත්, කොන්ත්‍රාත් හා තාවකාලික රැඳවුම් මුදල් යනාදී පොදු තැන්පත් ගිණුම් වල 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 කට වඩා වැඩි තැන්පතු රු.387,626,301 ක් වූ අතර එම තැන්පතු වලින් 2021 මැයි 20 දින වන විට රු.239,329,138 ක් අදාළ පාර්ශවයන්ට ගෙවීම් කර ඇති අතර ඉතිරි ශේෂය රු. 148,297,163 තවමත් ක්‍රියාත්මක වෙමින් පවතින කාර්යයන්ට අදාල තැන්පතු වේ.තවද වසර 05 ඉක්ම වූ තැන්පතු වල වර්තමාන ශේෂය රු.1,937,078 කි. එහි අදාල තැන්පත් ගිණුම් වර්ග අනුව විශ්ලේෂණය මගින් දක්වා ඇත. | තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සඵලදායිව පවත්වාගෙන යාමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සෑම සතියකම සඳුදා දින මාගේ ප්‍රධානත්වයෙන් අභ්‍යන්තර පාලන පද්ධතින්වල ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීම සඳහා රැස්වන අතර, එහිදී ගනු ලබන තීන්දු තීරණ නිලධාරීන් වෙත දැනුම්දෙනු ලබයි, 2021 වර්ෂයේ සිට අදාල කාර්යාල වෙත ගොස් ප්‍රධාන කාර්යාලයේ නිලධාරින් කාර්යාල අධීක්ෂණය කිරීමේ වැඩපිළිවෙලක් ද ක්‍රියාත්මක කරනු ලබයි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| (i) XIX පරිච්ඡේදයේ 3.3 වන වගන්තිය | සියළුම නිවාස ඒවා ලැබීමට සුදුසුකම් ඇති නිළධාරී පන්තිවලට අනුව ශ්‍රේණිගත කරනු ලැබිය යුතු වුවත් කොළඹ වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයෙන් පාලනය වන රත්මලාන ජාවත්ත පාරේ නාගලම් වීදියේ පිහිටි නිල නිවාස 12 ක් වෙන් කිරීම් කර නිලධාරීන්ගේ භාවිතය සඳහා ලබා දී නොතිබුණි. | වැල්ලවත්තේ ශාන්ත පීතර ප්‍රදේශයේ නිල නිවාස 10 කි. සේවයේ අවශ්‍යතාවය මත එහි සියලුම නිල නිවාස මාණ්ඩලික නිලධාරීන්ට වෙන්කර දී ඇත. නාගලම් වීදියේ ඇති නිල නිවාසය ගංවතුර රාජකාරී කරන කාර්ය මණ්ඩලය විසින් භාවිතයට ගැනේ. | නිල නිවාස ශ්‍රේණිගත කර සුදුසු නිලධාරීන්ගේ භාවිතයට ලබා දිය යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | XIX පරිච්ඡේදයේ 9 වන වගන්තිය | දෙපාර්තමේන්තුවට අයත් වෙනත් පුද්ගලයින් විසින් අත්පත් කර ගෙන ඇති නිල නිවාස 11 ක අනවසර පදිංචිකරුවන් ඉවත්කර එම නිවාසවල සන්තකය ආපසු ලබාගෙන නොතිබුණි. | නිල නිවාස 16 පිළිබඳ වාර්තමාන ප්‍රගතිය දක්වා ඇත. | නිල නිවාසවවල පදිංචිව සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කර ඒවායේ සන්නතකය දෙපාර්තමේන්තුවට පවරා ගත යුතු වීම. |
| (iii) | XXIV වන පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්ති | ලබා ගත් ණය සම්පූර්ණයෙන් අය කර ගැනීමට පෙර නිලධාරියෙකු මිය ගියහොත් ඔහුගෙන් රජයට අය විය යුතුව තිබෙන සියළුම ණය මුදල් ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට තිබෙන ඕනෑම මුදලකින් අය කර ගන්නා ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් වහාම ඉල්ලා සිටිය යුතු වුවත් රු.1,751,988 ක හිඟ හිටි ණය මුදලක් මිය ගිය නිලධාරින්ගෙන් අය කර ගෙන නොතිබුණි.<br>විශ්‍රාම ගොස් තිබූ සේවකයන් 196 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.20,798,439 ක් ණය ශේෂයක් අය විය යුතුව තිබුණි.<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වැඩ තහනමට | මියගිය නිලධාරින්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය වන රු.1,751,988 ක මුදලින් 2021 අප්‍රේල් 30 දිනට රු.212 ,251 ක මුදලක් අය වී ඇත. ඉතිරි මුදල වන රු.1,539 ,737 ක මුදල අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය වන රු. 20,798,439 ක මුදලින් මේ වන විට රු. 6,397,581 ක මුදලක් අය වී ඇත. ඉතිරි මුදල වන රු.14,400,858 ක මුදල අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. වැඩ තහනමට ලක් වූ නිලධාරින්ගෙන්, සේවය හැරගිය නිලධාරින්ගෙන් හා සේවය අත්හිටවූ නිලධාරින්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.3,308,119 ක මුදලින් මේ වන විට රු.16,500 ක මුදලක් අය වී ඇත. ඉතිරි මුදල වන රු.3,291,619 ක මුදල අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | අයවිය යුතු ණය ශේෂ සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | ලක් වූ නිලධාරීන්ගෙන්, සේවය හැර ගිය නිලධාරීන්ගෙන් හා සේවය අත්හිට වූ නිලධාරීන්ගෙන් අය විය යුතු රු.3,308,119 ක ණය මුදල් අදාළ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** **--------------------** | | | |
| (i) | මුදල් රෙගුලාසි 104 සිට මුදල් රෙගුලාසි 110 | 1979 සිට 2012 අතර කාලයේ සිදු වී තිබූ රු. 16,167,751 ක් වූ හානි හා පාඩු 34 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හානි පාඩු ලේඛනයේ තවදුරටත් ඉතිරිව ඇත්තේ අධිකරණ කටයුතු පවතින අලාභහානි, වැටුපෙන්/ විශ්‍රාම වැටුපෙන් අයවන අලාභහානි හා ලේඛනයෙන් ඉවත් කළ යුතු ලිපිගොනු බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 136, 137, 138, 139 | දෙපාර්තමේන්තුවේ මූල්‍ය බලතල පැවරීමේ අභ්‍යන්තර චක්‍රලේඛය අනුව එක් එක් තනතුර අනුව බලය දිය හැකි අනුමත කළ හැකි, සහතික කළ හැකි හා ගෙවිය හැකි මූල්‍ය සීමාවන් නිශ්චය කර නොතිබුණි. මුදල් පාලනය සම්බන්ධ බලතල | මීට අදාල චක්‍රලේඛය සංශෝධනය කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 2022 වර්ෂය සඳහා සංශෝධිත චක්‍රලේඛයක් නිකුත් කරමි. | මුදල් රෙගුලාසි වලින් දක්වා ඇති නියමයන් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පවරා දීමේදී මුදල් රෙගුලාසි 135 මගින් නියම කොට ඇති මූලික නිර්ණායක ආරක්ෂා වී නොතිබුණි. | | |
| (ඇ) | **භාණ්ඩාගාර චක්‍රලේඛ 05/2015** | භාවිතයෙන් ඉවත් කර තිබුණු වටිනාකම දක්වා නොමැති වාහන හා යන්ත්‍රෝපකරණ 147 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සියළුම කාර්යාල වලට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු පවත්වා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් ලබාදෙන නිර්දේශ අනුව භාණ්ඩ (වාහන හා යන්ත්‍ර නොවන) අපහරණ කටයුතු සිදුකරනු ලබයි.කිසියම් වර්ෂයක භාණ්ඩ සමීක්ෂණ කටයුතු පැවැත්වීමෙන් පසුව භාවිතයෙන් ඉවත්කරනු ලබන අයිතම නිර්දේශ ලබාගැනීම සඳහා ඉදිරි වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි.<br>භාවිතයෙන් ඉවත්කරනු ලබන වාහන හා යන්ත්‍ර සූත්‍ර අපහරණය කිරීම සඳහා අවස්ථානුකූල ව වරින් වර කමිටු පත් කර අපහරණය කිරීම සිදුකරනු ලබන අතර මේ වන විට භාවිතයෙන් ඉවත් කර ඇති වාහන හා යන්ත්‍ර සූත්‍ර හඳුනාගැනීම සහ තක්සේරු කිරීම සඳහා කමිටු පත්කර ඇත. අදාළ වාර්තා ලද පසු ටෙන්ඩර් මගින් විකිණීමට කටයුතු කරමි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1994 ජුනි 14 දිනැති අංක 23/94 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | වයස අවුරුදු 45 ඉක්මවා තිබියදී පත්වීම් ලබා දීම විධිමත් පත්වීමක් නොවන බව හා | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් වරින්වර තාවකාලික, අනියම් හා කොන්ත්‍රාත් සේවකයින් ස්ථිර කිරීමට අදාලව නිකුත් කරන ලද | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | විශ්‍රාම වැටුප් හිමි නොවන බව දක්වා තිබියදි දෙපාර්තමේන්තුවේ වයස අවුරුදු 45 ඉක්මවූ සේවකයින් 302 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබා දී තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව මෙම සේවකයින්ට ස්ථිර පත්වීම් ප්‍රදානය කර ඇත. | |
| (ඉ) | 2015 ජුලි 23 දිනැති අංක 07/2015 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | දෛනික ගෙවීම් හෝ මාසික වැටුප් අහිමි රජයේ සේවයේ නියුතු සේවකයින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා දිය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ අනියම් සේවකයන් 302 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පරිචය අනුව, තදුචිත පදනම මත බඳවාගත් සේවකයින්ට එම දෛනික සේවා කාලයට අදාලව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබාදිමට කටයුතු කර නැත. | -එම- |

**2.7 අවිධිමත් ගනුදෙනු**

--------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගම්පහ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය මගින් 2019 වර්ෂයේ දී වැලිකඩ ව්‍යාපාරයේ වම් ඉවුර ඇළ ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා උතුරු නිවන්දම ගොවි සංවිධානයට රු.149,100 කට පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්තුව ගොවි සංවිධානය නමින් සහකාර ඉංජිනේරුවරයා විසින් සිදුකර තිබුණ අතර ඔහු විසින්ම එහි අධීක්ෂණය, රු.134,873 ක මුදල් ලබා ගැනීම ආදී කටයුතු සිදුකර තිබූ බව 2020 සැප්තැම්බර් 17 දින සිදු කළ භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | මෙම සහකාර ඉංජිනේරුවරයා සම්බන්ධව මූලික විමර්ෂණයක් සිදුකිරීමට කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු වාර්තාවේ නිර්දේශ මත පදනම්ව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | අදාළ විමර්ශන කටයුතු හා ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් සිදු කළ යුතු වීම. |

**2.8 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාරිමාර්ග දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 14 ක් හා ව්‍යාපෘති කාර්යාල 06 ක් විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් 94 ක් අතරින් ගිණුම් 21 ක චෙක්පත් අත්සන් කිරීමේ හා ගනුදෙනු කිරීමේ කටයුතු සඳහා ගණකාධිකාරීවරුන් නම් කර නොතිබුණි. | කලාප කාර්යාල වල ගණකාධිකාරීවරුන් ස්ථාන මාරු වී යාම නිසා හා ප්‍රසූත නිවාඩු ලබා සිටීම නිසා ඒ සඳහා වැඩ බැලීමට වෙනත් නිලධාරීන් පත් කිරීම වැනි හේතු නිසා මෙලෙස සිදු වී ඇත. ගණකාධිකාරීවරුන්ගේ අත්සන් ඇතුලත් කර අත්සන් කාඩ් පත් බැංකුවට ඉදිරිපත් කිරීම මේ වනවිට ඉටු කරමින් පවතී. | පද්ධති සමාලෝචනයේ දී වාර්තාකරණ පද්ධති නිශ්චය කර අදාළ වගකීම් පැවරිය යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ඇස්තමේන්තු පිරිවැය රු.39,999,000 ක් වූ නාච්චාදූව වැව් රක්ෂිතය තුළ වාරිමාර්ග කෞතුකාගාරයක් සහ පුහුණු ආයතන ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු. 30,811,025 ක් වැය කර තිබුණද, ඉදිකිරීම කටයුතු අවසන් කර නොතිබුණි. ගොඩනැගිල්ලේ මූලික සැලසුම් පලාත් පාලන ආයතන වෙතින් අනුමත කරවාගෙන නොතිබුණු අතර ගොඩනැගිල්ල ඉදිකිරීමේදී මූලික සැලස්මෙන් බැහැරව නිලධාරීන්ගේ අභිමතය පරිදි ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණි. තවද අමතර පිරිවැය ඇස්තමේන්තු 02 ක් ඉදිරිපත් | නාච්චදූව වැව් රක්ෂිතය තුල ඉදි කිරීම් ආරම්භ කර ඇති ගොඩනැගිල්ල සඳහා දැනට ඉදිකර ඇති සියලු උපාංග හා ඉදිකිරීමට යෝජිත සියලු උපාංග අයත් වන සේ ඇස්තමේන්තුවක් හා සැලැස්මක් පිළියෙළ කර ඇත. ඒ සඳහා නියමිත අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඉදිකිරීම් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. මිලදී ගන්නා ලද අමුද්‍රව්‍ය ආරක්ෂිතව ගබඩා කර ඇත. | ඇස්තමේන්තු අනුමත කර ගැනීමෙන් පසුව ඉදිකිරීම් ආරම්භ කළ යුතු අතර වත්කම් කාර්යක්ෂමව භාවිතා කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණ ද ඊට අනුමැතිය නොලැබීම හා ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නතර වී තිබුණි. එමෙන්ම මෙම ඉදිකිරීම වෙනුවෙන් 2014 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු වටිනාකම රු.3,962,121 ක් වූ අමුද්‍රව්‍ය හා සවි කිරීම් වර්ෂ 6 කට අධික කාලයක් භාවිත නොකිරීම නිසා විනාශ වෙමින් පැවතුණි. | | |
| (ආ) | යාන් ඔය ජලාශ ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු සඳහා 2013 මැයි 31 දිනැති අංක අමප/13/0721/508/007 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක් එක් කාර්යය සඳහා වෙන් කර තිබූ රු.මි.36,855 ක ප්‍රතිපාදනයෙන් රු.මි.33,424 ක් වැය කර තිබුණි. එහිදී අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වෙන් කර තිබූ ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා වියදම් දරා තිබුණි. ඒ අතරින් ඇතැම් කාර්යයන් ප්‍රසම්පාදන සීමාවන් ඉක්මවා වර්ෂ 02 කට වැඩි කාලයක් ගත වී තිබූ අතර ඇතැම් කර්තව්‍යයන් ඉටුකර නොතිබුණි.<br><br>පහල නිම්න මැනුම් කටයුතු හා සමීක්ෂණ කටයුතු, වම් ඉවුරු ඇල ඉදි කිරීම ඉඩම් පවරා ගැනීම හා නැවත පදිංචි කිරීම් කටයුතු සඳහා වෙන්කර තිබූ මුදල ඉක්මවා පිළිවෙලින් රු.මිලියන 6.8 ක්, රු.මි.3,623 ක් හා රු.මි.2,215 ක් වැය කර තිබුණි.<br><br>යාන් ඔය වම් ඉවුරු අදාල ඉදි කිරිම සඳහා 2017 දෙසැම්බර් 12 දින වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් ලබාදී තිබූ ඇ.ඩො.මි.39.5 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුම යටතේ වූ ප්‍රමාණ පත්‍රයේ සඳහන් කාර්යයන් මූලික සැලසුම් වෙනස්වීම හේතුවෙන් ඉටු කර නොතිබුණි. | යාන්ඔය වම් ඉවුරු ඇලේ මූලික සැලැස්මට අනුව අතරමැදි ජලාශය ඉදිකිරීමට යෝජිත ස්ථානයේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් කුඹුරු යායක් හා ඊට ඉහළින් පදවිය රක්ෂිත කැලය පිහිටා ඇත. මෙම අතරමැදි ජලාශය ඉදිකිරීමෙන් අක්කර 400 ක පමණ ප්‍රදේශය ජලයෙන් යටවන අතර එමඟින් අදාළ කුඹුරු යාය ජලයෙන් යටවේ. එහෙත් මෙම අතරමැදි ජලාශයෙන් වගා බිම් සඳහා සෘජුව ජලය ලබා නොදීමත්, ජලයෙන් යටවන අක්කර 400 ක පමණ ප්‍රදේශයේ වගා බිම් සඳහා නැවත විකල්ප ඉඩම් ලබා දීම සඳහා ස්ථාන නොමැති වීමත්, විකල්ප ඉඩම් ලබා දිම පිණිස පදවිය හා කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල රක්ෂිත නොවන ඉඩම් සීමා සහිත වීමත් යන කරුණු සැළකිල්ලට ගෙන මෙම අතරමැදි ජලාශ ඉදිකිරීම සිදු නොකරන ලදි. ඒ වෙනුවට යාන්ඔය වම් ඉවුරු ඇළ අදාළ ප්‍රදේශය හරහා විවෘත කොන්ක්‍රීට් ඇළක් ලෙස ඉදිකිරීම සිදුවිය. | මූලිකව සැලසුම් කළ පරිදි ව්‍යාපෘතියේ කටයුතු ඉටුකිරීම කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | දකුණු ඉවුර අදාල ඉදි කිරීම් ප්‍රවේශ මාර්ග හා පාලම් ඉදි කිරීම, පවතින වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය හා පාරිසරික කළමනාකරණ කටයුතු සඳහා රු.මි.4,530 ක් වෙන් කර තිබූ නමුත් එහි කටයුතු වෙනුවෙන් රු.මි.1,270 ක් පමණක් වැය කර තිබුණි. ඒ යටතේ සැලසුම් කල රු.මි.3,260 ක වැඩ සඳහා වෙන්කල අරමුදල් අනුමැතියකින් තොරව අනිකුත් කාර්යන් සඳහා වැය කර තිබුණි. | යාන්ඔය ව්‍යාපෘතියේ අනුමත ඇස්තමේන්තුව සංශෝධනය කිරීම සඳහා අනුමත කර ගැනීමට ඉදිරිපත් කිරීම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කමිටුවක් පත් කර කමිටුවේ නිර්දේශ ද සහිතව අමාත්‍ය මණ්ඩල වෙත ඉදිරිපත් කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යශයේ ලේකම්වරයා වෙත මේ වන විට ඉදිරිපත් කර ඇත. | සැලසුම් කළ පරිදි ඉදිකිරීම් කටයුතු සිදු කළ යුතු වීම. |

**3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක ගම්පහ අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒක්බද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලෙස රු.මි.3,800 ක් බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2016 මාර්තු 21 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව වසර 03 කට වැඩි කාලයක් ගතව ඇතත් ව්‍යාපෘතිය ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 560 ක් වැයකර ව්‍යාපෘතියේ ජලනල එළීම හා අනෙකුත් කටයුතුවලින් සියයට 33 ක් පමණක් නිම කොට පැවතුණි. ජල මූලාශ්‍ර ඉදිකිරීම ප්‍රමාදවීම හේතුවෙන් එම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට 2021 අප්‍රේල් දක්වාම නොහැකි වී තිබුණි. ව්‍යාපෘතියට කාර්ය මණ්ඩලය 27 ක් අනුමත කරගෙන තිබුණු අතර 18 දෙනෙකු බඳවාගෙන තිබුණි. 2019 ජූනි මස ජලාශයේ ඉදකිරීම් කටයුතු වීන සමාගමක් වෙත පවරා තිබුණද, කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘතිය සඳහා කාර්ය මණ්ඩල පත්කර ගැනීමද අමාත්‍යාංශය මඟින් සිදුකර ඇති අතර, ජලාශයේ පාලන ලක්ෂ පිහිටුවීම, පිටාර මට්ටම ලකුණු කිරීම, ඉඩම් අත්පත් කර ගැනීම, පාරිසරික අනුමැතිය ලබාගැනීමේ කටයුතු, ජලාශය සඳහා මැණුම් කටයුතු කිරීම, රුවන්වැල්ල හා අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ජලාශයට යටවන ප්‍රදේශ වල ඉඩම් අත්පත් කර ගැනීම, ජලයට යටවන පාරවල් හඳුනා ගැනීම හා විකල්ප මාර්ග හඳුනා ගැනීම සිදුකර ඇත. තවද, බස්නාගොඩ ජලාශය සැලසුම්, ඉදිකිරීම් හා පරීක්ෂාව සඳහා ජාතික ජලසම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලය අතර, අවබෝධතා ගිවිසුමක් 2019 ජූනි 12 වන දින එළඹ ඇත. බස්නාගොඩ ජලාශයේ ඉංජිනේරුමය, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් **(EPC)** කොන්ත්‍රාත් ගිවිසුමක් වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා හා Sinohydro Corparation Limited | ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනවලට ව්‍යාපෘතිය නිම කිරීම සඳහා කටයුතු කළ යුතු අතර කාර්යය මණ්ඩලය පිළිබඳව සමාලෝචනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| පිළිබඳ සමාලෝචනයකින් තොරව ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි. | අතර 2019 ජුනි 13 වන දින අත්සන් කර ඇත.<br><br>ඒ අනුව පසුගිය කාලය තුලදි Sinohydro Corparation Limited සමාගම ජලය සඳහා විමර්ශන කටයුතු , සැලසුම් කටයුතු නිම කර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. ජලාශයේ ඉදිකිරීම් මෙම අවුරුද්ද අවසානයේ නිම කිරීමට අපේක්ෂා කෙරේ. | |

## 3.4 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 දෙසැම්බර් මස වැඩ ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ රත්මලාන මධ්‍යම යාන්ත්‍රික වැඩපලේ වාහන සේවා මධ්‍යස්ථානයක් සඳහා 2016 වර්ෂයේදී මිළදී ගෙන තිබුණු රු.1,065,600 ක යන්ත්‍ර හා උපාංග සහ 2017 වර්ෂයේ ඉදිකර තිබුණු වටිනාකම රු. 7,431,464 ක් වූ වාහන සේවා ගොඩනැගිල්ලේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණේ 2020 දෙසැම්බර් මාසයේදීය. ඒ අනුව වත්කම් වර්ෂ 3 ක කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි. | රත්මලාන මධ්‍යම යාන්ත්‍රික වැඩපලේ සේවා මධ්‍යස්ථානයක් 2017 දෙසැම්බර් මස වැඩ ආරම්භ කිරීමට සැලසුම් කර තිබිණි. 2017 වසරේදී වාහන සේවා ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු සිදු කර ඇත. එහෙත් වාර්ෂිකව ලැබුන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ නිසා සේවා මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය අනිකුත් පහසුකම් සියල්ලම සම්පූර්ණ කිරීමට හැකිවුයේ 2020 පෙබරවාරි මාසයේදීය. රට තුල පැවති වසංගත තත්වය හේතුවෙන් එහි කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද විය. එබැවින් එය අරම්භකිරීමේ කටයුතු 2020 දෙසැම්බර් මාසයේදී සිදු කර ඇත. | ව්‍යාපෘතියේ කටයුතු සැලසුම් කළ පරිදි ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.5 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රබෑව යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාල භූමිය තුළ ප්‍රයෝජනයට ගත හැකි ධාවන තත්ත්වයේ පවතින ලෝඩර් 03 ක්, කැටපිලර් යන්ත්‍රයක් සහ වයිබ්‍රේටරයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වර්ෂයකට අධික කාලයක් අනාරක්ෂිතව ගාල් කර තිබුණි. | විශාල පරිමාණ වැඩබිම් වල යොදා ගන්න ලෝඩර් 03 ක්, කැටපිලර් යන්ත්‍රයක් සහ වෛබ්‍රේටරයක් එවකට එවැනි වැඩබිම් නොතිබීම හේතුවෙන් රබෑව යාන්ත්‍රික වැඩපළේ ගාල් කර ඇත. මේ වන විට එම යන්ත්‍ර පහල මල්වතුඔය ජලාශ ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා භාවිත කෙරේ. | වත්කම් කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු වීම. |
| (ආ) | හල්පාතොට යාන්ත්‍රික වැඩපල වෙත අළුත්වැඩියාව සඳහා 2020 වර්ෂයේ යොමු කර තිබුණු වාහන 02 ක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | හල්පාතොට යාන්ත්‍රික වැඩපල වෙත 2020 වසරේදී යොමු කර ඇති එම වාහන දෙක වසර තිහකට වඩා පැරණිය. එබැවින් ඒවා අලුත්වැඩියා කල හැකි තත්වයේ නොමැත. පැවති වසංගත තත්වය හමුවේ අපහරණය කිරීම සඳහා යොමු කිරීමට ප්‍රමාද වී ඇති අතර මේ වන විට අපහරණය කිරීමට කටයුතු කර ඇත. | -එම- |
| (ඇ) | දෙපාර්තමේන්තුවට අයත් වටිනාකම ගණනය කළ නොහැකි වාහන 45 ක් වර්ෂයකට අධික කාලයක් තිස්සේ බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණි. එම වාහන දෙපාර්තමේන්තුව වෙත නැවත පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අයත් එම වාහන සියල්ලම වර්ෂ 30 කටත් වඩා පැරණි බැවින් වටිනාකම තක්සේරු කල නොහැකිය. වාරිමාර්ග කළමනාකරණ අංශය ආරම්භ කරන ලද්දේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේය. එබැවින් එම වාහන (කාර් රථ 3, ජීප් රථ 17, ඩබල් කැබ් රථ 14) වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇත. පසුකාලීනව එම අංශය වාරිමාර්ග අමාත්‍යාංශය යටතට ගෙන ඇත. එම වාහන පවරා ගන්න ලෙස වාරිමාර්ග කළමනාකරණ අංශය වෙත දෙනුම් දී ඇත. වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එකම අමාත්‍යාංශය යටතේ පැවති කාලයේදී මෙම වාහන | දෙපාර්තමේන්තුවට අයත් වත්කම පවරා ගැනීම කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ලබා දී ඇත. එම වාහනද පවරා ගන්නා ලෙස දැනුම් දී ඇත. | |
| **(ඇ)** | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 1552 කින් නිල නිවාස 236 ක් භාවිතයට ගෙන නොතිබුණි. ඒ අතරින් නිවාස 109 ක් සම්පූර්ණයෙන් අබලන් තත්ත්වයේ පැවතුණි. අලුත්වැඩියා කර පදිංචියට සුදුසු ආකාරයට පත්කිරීමේ හැකියාව පවතින නිවාස 127 ක් විය. ඒවා භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කිරීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාසවල තොරතුරු ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 කින් ලබාගත යුතුව ඇත. කොවිඩ් 19 වසංගතය නිසා තොරතුරු ලබා ගැනීමේ ප්‍රායෝගික ගැටළුවක් පවති. කාර්යාල කටයුතු යථාතත්ත්වයට පත්වීමෙන් සති දෙකක් ඇතුලත තොරතුරු එවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස නිසි කළමනාකරණයකින් යුතුව නඩත්තු කළ යුතු වීම. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ----------------------------------- | ----------- |
| (අ) | රබෑව කලාප යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලය වෙත අලුත්වැඩියාව සඳහා යොමු කර තිබුණු වාහන 37 ක් අලුත්වැඩියා කටයුතු නිම නොකිීම නිසා වසර 01 සිට වසර 06 ක කාලපරාසයක් වැඩබිමේ රඳවා තිබුණි. | වාහන අලුත්වැඩියාව සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි නොලැබෙන අතරම ඒ සඳහා අවශ්‍ය කර්ය මණ්ඩලයද ප්‍රමාණවත් පරිදි නොමැත. වාහන අලුත් වැඩියාව සිදුකරනු ලබන්නේ ප්‍රමුකත්වය මතය. එසේ කටයුතු කිරීමේදී ප්‍රමුකත්වයක් නොමැති වාහන අලුත් වැඩිය කිරීමට කල් ගත වේ. | අලුත්වැඩියා කටයුතු කාර්යක්ෂම කර වත්කම්වල ආරක්ෂාව තහවුරු කළ යුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාසවලින් වෙනත් භාහිර ආයතන හා පුද්ගලයින් වෙත ලබා දී තිබුණු නිල නිවාස 41 කින් බදු කුලී අයකරගෙන නොතිබුණි. වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දී තිබුණු නිල නිවාස 80 කින් ප්‍රවර්තන | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාසවල තොරතුරු ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 කින් ලබාගත යුතුව ඇත. කොවිඩ් 19 වසංගතය නිසා තොරතුරු ලබා ගැනීමේ ප්‍රායෝගික ගැටළුවක් පවති. කාර්යාල කටයුතු | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස වලින් කුලී අයවීම නිසි පරිදි කළමනාකරණය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය තුළ නිවාස 02 කින් පමණක් බදු කුළී අයකරගෙන තිබුණු අතර එම වටිනාකම රු.1,250,140 ක් විය. නිවාස 78 කින් කුලී අයකරගෙන නොතිබුණි. | යථාතත්ත්වයට පත්වීමෙන් සති දෙකක් ඇතුලත තොරතුරු එවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | |
| (ඇ) | වීරකැටිය ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ සේවය කළ සහකාර වාරිමාර්ග ඉංජිනේරුවරයෙකු 2003 වර්ෂයේ දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් පදවමින් සිටිය දී සිදු වූ රිය අනතුරක් හේතුවෙන් අගතියට පත් පාර්ශවයට දෙපාර්තමේන්තු බැංකු ගිණුමෙන් රු.3,708,100 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. අලාභයේ සම්පූර්ණ වගකීම නිලධාරියා දැරිය යුතු අතර අලාභය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන නොතිබුණි. එම අලාභය සමාලෝචිත වර්ෂය අවසාන දිනට අක්මුදල් ගිණුමේ නොපියවුනු ශේෂයක් ලෙස පැවතුණි. | නීතිපති දෙපාර්තමේන්තුවෙන් මෙම අලාභය අයකර ගැනීමට විමසීමේදී ගරු අධිකරණය විසින් ලබාදුන් තීන්දුවකට එරෙහිව නඩු පැවරිය නොහැකි බව වාචිකව දන්වා ඇත. ඒ අනුව සිද්ධියට අදාළ පාර්ශ්වය වන විශ්‍රාමික ඉංජිනේරු මහතාගේ විශ්‍රාම වැටුපෙන් ,විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාවය මත මාසිකව රු.10,000 බැගින් අය කර ගැනීමට කටයුතු කර ඇත. | අක්මුදල් ගිණුමේ ශේෂය නොපමාව පියවා ගත යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්යය මණ්ඩලය 7,112 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 5,391 ක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 1,521 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ නිලධාරීන් තිදෙනෙකු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. ඒ අතරින් කොන්ත්‍රාත් පදනම මත 2020 දෙසැම්බර් 15 දින සිට බඳවාගෙන තිබූ වයස අවුරුදු 64 ක් වූ පරිපාලන නිලධාරී පත්වීම සඳහා විගණන දිනය වන විටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී නොතිබුණි. ආයතනයේ ඉහළ කළමනාකරණ මට්ටම නියෝජනය | 6000 කට ආසන්න සේවක සංඛ්‍යාවකගේ පෞද්ගලික ලිපි ගොනු වල රාජකාරි ඉටු කළ යුතු බැවින්ද, රාජකාරි කරගෙන යාමේදී බොහෝ දුෂ්කරතා වලට මුහුණ දී ඇති බැවින්ද රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ වාචික උපදෙස් අනුව රාජ්‍ය ආයතන රාශියකම සේවය කර පළපුරුද්ද ඇති විශ්‍රාමික පරිපාලන නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය ලබා ගන්නා ලදී. අදාළ | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කරන අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 4 ක් අතරින් තනතුරු 03 ක් ම වැඩ බැලීමේ පදනම මත සම්පූර්ණ කර තිබුණි. ආයතනයේ මූල්‍ය කළමනාකරණ කටයුතු පිළිබඳ අධීක්ෂණ වගකීම දරන ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර 2018 වර්ෂයේ සිට වැඩ බැලීමේ පදනම මත පත්කර තිබුණි. | ලියකියවිලි මේ වනවිට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු කර ඇති අතර ඉදිරියේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබීමට නියමිතය. අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සඳහා පූර්ණකාලීනව වැඩබැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් අනුමැතිය දී ඇත. ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/APP/05/03/23/2017 හා 2017 දෙසැම්බර් 27 දිනැති ලිපියෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුරේ 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින හෝ පුරප්පාඩුව සම්පූර්ණවන දින හෝ යන දින දෙකෙන් පළමුව එළඹෙන දින දක්වා පූර්ණ කාලීනව වැඩ බැලීමට පත් කර ඇත. | |
| (ආ) | අනුමත කොට්ඨාස සහකාර තනතුරු 63 ක් පුරප්පාඩුව පැවතුණි. ඒ සඳහා 2020 පෙබරවාරි 03 වැඩ බැලීම සඳහා ඉංජිනේරු සහකාර නිලධාරීන් 59 දෙනෙකු පත් කර තිබුණි. අදාළ වැඩ බැලීමේ පත්වීම් ලබා දීම සඳහා නිලධාරීන් තෝරා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. ඉංජිනේරු සහකාර සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් 23 දෙනෙකු හා III ශ්‍රේණියේ එක් නිලධාරියෙකු පත්කිරීම සඳහා වූ නිර්ණායක පිළිබඳ පැහැදිලි නොවුණි. | කොට්ඨාශ වල අත්‍යාවශ්‍ය රාජකාරි ඉටු කර ගැනීම සඳහා එම තනතුරේ නිලධාරීන් සිටීම අත්‍යාවශ්‍ය බැවින් එවකට කොට්ඨාශ වල සේවය කළ නිලධාරීන් අතරින් ජ්‍යෙෂ්ඨ තම හා සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් අතරින් ඉංජිනේරු සහකාර සේවයේ පත්වීම් බලධාරියා වන වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් කොට්ඨාශ සහකාර තනතුරේ රාජකාරි ඉටු කිරීමට නිලධාරීන් පත් කර ඇත. කොවිඩ් 19 තත්ත්වය හමුවේ සියළු කටයුතු කලට වේලාවට සිදු කිරීමට අපහසුතා ඇති බැවින්, ඉදිරියේදී | -එම- |

| | | | |
|---|---|---|---|
| | | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තුවේ. | |
| (ඇ) | දීපව්‍යාප්ත හා ඒකාබද්ධ සේවාවලට අයත් තනතුරු 20 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය 53 ක් වූ අතර ඉන් 29 ක් දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. | දීප ව්‍යාප්ත හා ඒකාබද්ධ සේවා වලට අයත් තනතුරු සඳහා ඇති පුරප්පාඩු සංඛ්‍යාව 92 කින් රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත එම පුරප්පාඩු කඩිනමින් පුරවන මෙන් දැනටමත් දන්වා ඇත. | -එම- |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය ප්‍රධාන කාර්යාලය, කලාප වාරිමාර්ග කාර්යාල, සහ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල අතර අනුයුක්ත කර ඇති ආකාරය පිළිබඳව නිසි ක්‍රමවේදයක් නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය, ප්‍රධාන කාර්යාලය වාරිමාර්ග කාර්යාල හා ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වලට පැවරී ඇති වැඩ ප්‍රමාණයට සරිලන පරිදි සකස් කරන ලද අනුමත කාර්ය මණ්ඩලයක් පවතී. | සේවා අවශ්‍යතාවය අනුව විධිමත්ව සේවකයින් කාර්යාල වෙත අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතු වීම. |